# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2349/02 - 2023 සැප්තැම්බර් මස 11 වැනි සඳුදා - 2023.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 9/2005 (III)

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

53 වන වගන්තිය යටතේ වන නියමය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 53 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති, මෙරෙංඤ්ඤගේ ප්‍රියන්ත ප්‍රනාන්දු වන මා විසින්, අධිකාරියේ නිර්දේශය මත මෙම නියමය මගින්-

(අ) සංචාරක කටයුතු පනත යටතේ සංචාරක සේවාවක් ලෙස වර්ගීකරණය කර ඇති කොළඹ මහනගර සහා බලප්‍රදේශය තුළ පිහිටි සංචාරක හෝටලයක, එහි කාමරයක නවාතැන් ගැනීම සඳහා සහ සපයනු ලැබිය හැකි ආහාර සඳහා නේවාසිකයකු සඳහා වන ගාස්තු සම්බන්ධයෙන් එක් එක් නේවාසිකයකු වෙත පනවනු ලබන, නියම කරනු ලබන, ඉල්ලා සිටිනු ලබන, හෝ අයකර ගත යුතු අවම මිල ගණන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මිල ගණන් විය යුතු බවට; සහ

(ආ) I වන උපලේඛනයේ දක්වා ඇති මිල ගණන්වලට අනුකූල නොවීම හේතුවෙන් බලපත්‍රයක් අවලංගු කර ඇති සංචාරක හෝටලයක් නැවත ලියාපදිංචි කිරීම සඳහා සහ බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් එවැනි සංචාරක හෝටලයකින් අයකළ යුතු අවම ගාස්තු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු විය යුතු බවටත්,

මෙයින් නියම කරනු ලැබේ.

මෙහි I වන සහ II වන උපලේඛනවල දක්වා ඇති මිල ගණන් සහ ගාස්තු 2023 ඔක්තෝබර් මස 1 දින සිට බලාත්මක විය යුතු ය.

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 53 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලදුව, 2009 ඔක්තෝබර් මස 05 දින අංක 1662/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2011 මාර්තු මස 17 දින අංක 1697/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියම, ඒ යටතේ මීන් පෙර සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙමගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබේ.

**සභාපති,**
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

2023 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

## I වන උපලේඛනය

### *I වන කාණ්ඩය*

1. සංස්ථාපිත සහ නිදහස් ස්වාධීන සංචාරක හෝටල් කාමරයක් සඳහා වන මිල ගණන් එක්සත් ජනපද ඩොලර්වලින් හෝ ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් පහත පරිදි විය යුතුය-

| | | | *එක්සත් ජනපද ඩොලර්* |
|---|---|---|---|
| 1.1 | තරු පහේ සංචාරක හෝටල් | - | 100 |
| 1.2 | තරු හතරේ සංචාරක හෝටල් | - | 75 |
| 1.3 | තරු තුනේ සංචාරක හෝටල් | - | 50 |
| 1.4 | තරු දෙකේ සංචාරක හෝටල් | - | 35 |
| 1.5 | තරු එකේ සංචාරක හෝටල් | - | 20 |

2. මෙම උපලේඛනයේ I වන කාණ්ඩයෙහි I වන අයිතමයේ නිශ්චිතව සඳහන් කර ඇති මිල ගණන් පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතු වේ-

2.1 I වන කාණ්ඩයෙහි I වන අයිතමයේ නිශ්චිතව සඳහන් කර ඇති මිල ගණන් පැය විසිහතරක කාලයක් සඳහා ගෙවිය යුතු වන අතර, එම මුදලට සේවා ගාස්තු සහ වෙනත් අදාළ බදු, සපයනු ලැබිය හැකි වෙනත් යම් සේවාවන් හෝ පහසුකම් සඳහා ගාස්තු හෝ අයකිරීම් ඇතුළත් නොවිය යුතු ය.

2.2 කෙටිකාලීන ව්‍යාපාර (මාසයකට අඩු) සඳහා වන නේවාසික/මහල් හෝටල් සම්බන්ධයෙන් වන විට නේවාසිකයන් දෙදෙනෙකු නැවතී සිටින කාමරය එම දෙදෙනාට අමතරව අතිරේක අමුත්තකු නවාතැන් ගැනීම සඳහා එක්සත් ජනපද ඩොලර් පහළොවක් හෝ ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් අතිරේකව අයකරනු ලැබිය යුතු ය.

### *II වන කාණ්ඩය*

1. රැස්වීම්, දිරි ගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සඳහා වූ මිල ගණන් සඳහා I වන කාණ්ඩයේ මිල ගණන් මත 20% ක කොමිස් මුදලක් තිබිය යුතු ය.

2. විවේකය සම්බන්ධයෙන් වූ මිල ගණන් සඳහා I වන කාණ්ඩයේ මිල ගණන් මත 10% ක කොමිස් මුදලක් තිබිය යුතු ය.

### *III වන කාණ්ඩය*

1. ගුවන් සේවාවල කාර්ය මණ්ඩලය සඳහා වන හෝටල් කාමර මිල ගණන්, එක්සත් ජනපද ඩොලර්වලින් හෝ ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් පහත පරිදි විය යුතු ය :-

| | | | *එක්සත් ජනපද ඩොලර්* |
|---|---|---|---|
| 1.1 | තරු පහේ සංචාරක හෝටල් | - | 75 |
| 1.2 | තරු හතරේ සංචාරක හෝටල් | - | 55 |
| 1.3 | තරු තුනේ සංචාරක හෝටල් | - | 40 |
| 1.4 | තරු දෙකේ සංචාරක හෝටල් | - | 30 |
| 1.5 | තරු එකේ සංචාරක හෝටල් | - | 20 |

2. III වන කාණ්ඩයෙහි I වන අයිතමයේ නිශ්චිතව සඳහන් කර ඇති මිල ගණන් පැය විසිහතරක කාලයක් සඳහා ගෙවිය යුතු වන අතර, එම මුදලට සේවා ගාස්තුව සහ වෙනත් අදාළ බදු සපයනු ලැබිය හැකි වෙනත් යම් සේවා හෝ පහසුකම් සඳහා ගාස්තු හෝ අයකිරීම් ඇතුළත් නොවිය යුතු ය.

### *IV වන කාණ්ඩය*

1. නේවාසික අමුත්තන් සඳහා පමණක් වන ආහාර මිල ගණන් එක්සත් ජනපද ඩොලර්වලින් හෝ ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් පහත පරිදි විය යුතු ය-

| | *උදෑසන ආහාරය එ. ජ. ඩො.* | *දිවා ආහාරය එ. ජ. ඩො.* | *රාත්‍රී ආහාරය එ. ජ. ඩො.* |
|---|---|---|---|
| 1.1 තරු පහේ සංචාරක හෝටල් | 10 | 15 | 17 |
| 1.2 තරු හතරේ සංචාරක හෝටල් | 09 | 14 | 16 |
| 1.3 තරු තුනේ සංචාරක හෝටල් | 08 | 10 | 14 |
| 1.4 තරු දෙකේ සංචාරක හෝටල් | 06 | 08 | 10 |
| 1.5 තරු එකේ සංචාරක හෝටල් | 05 | 07 | 09 |

2. IV වන කාණ්ඩයෙහි I වන අයිතමයේ නිශ්චිතව සඳහන් කර ඇති මිල ගණන් පැය විසිහතරක කාලයක් සඳහා ගෙවිය යුතු වන අතර එම මුදලට සේවා ගාස්තුව සහ වෙනත් අදාළ බදු, සපයනු ලැබිය හැකි වෙනත් යම් සේවා හෝ පහසුකම් සඳහා ගාස්තු හෝ අයකිරීම් ඇතුළත් නොවිය යුතු ය.

### II වන උපලේඛනය

නැවත ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු රුපියල් (රු.) වලින් පහත දැක්වෙන පරිදි විය යුතු ය.

| *කාණ්ඩය* | *නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තුව (රු.)* | *බලපත්‍ර ලබා ගැනීමේ ගාස්තුව (රු.)* |
|---|---|---|
| 1. තරු පහේ සංචාරක හෝටල් | 3,000,000 | 2,000,000 |
| 2. තරු හතරේ සංචාරක හෝටල් | 2,300,000 | 1,500,000 |
| 3. තරු තුනේ සංචාරක හෝටල් | 1,850,000 | 1,200,000 |
| 4. තරු දෙකේ සංචාරක හෝටල් | 1,500,000 | 1,000,000 |
| 5. තරු එකේ සංචාරක හෝටල් | 1,100,000 | 750,000 |

EOG 09 - 0094

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.